දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතිය - **III** කොටස - **2017**

---

දක්ෂිණ අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ III කොටසේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා චීන ආනයන හා අපනයන බැංකුව අතර **2014** සැප්තැම්බර් **16** දින එළඹි අංක පීබීසී අංක **(2014)17** එකතු අංක **(520)** දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ **154(1)** ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2** ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. හම්බන්තොට අන්තර්ජාතික කේන්ද්‍රයේ සංවර්ධනය සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා යටිතල පහසුකම් සැපයීම, මාර්ග ජාලය දියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. දක්ෂිණ අධිවේගී මාර්ගය දියුණු කිරීමේ කටයුතු කොටස් **04** කට බෙදා ඇති අතර වැටිය සිට අන්දරවැව දක්වා වූ කි.මී. **15** ක කොටසේ ඉදිකිරීම් කටයුතු ව්‍යාපෘතියේ III කොටස යටතේ ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ III කොටස යටතේ වූ වැඩවල ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන **36,174** ක් වූ අතර සිවිල් වැඩවල පිරිවැය වූ රු.මිලියන **31,574** කට සමාන එ.ජ.ඩො.මිලියන **252** ක් වූ අතර එය චීන ආනයන හා අපනයන බැංකුව විසින් සැපයීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු **2016** ජනවාරි **25** දින ආරම්භ කිරීමට සැලසුම් කර තිබූ අතර **2018** නොවැම්බර් **24** දින වන විට නිම කිරීමට නියමිතව තිබුණි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4** විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත

සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 2.2 ඡේදයේ සඳහන් කරුණුවලින් සිදුවන බලපෑම හැර මා දරන්නා වූ මතය වන්නේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය
---------------------------------

3.1 අරමුදල් උපයෝජනය
------------------------

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද ප්‍රතිපාදන | උපයෝජනය කරන ලද අරමුදල් | |
|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දිනට |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| චීන ආනයන හා අපනයන බැංකුව | 252 | 33,555.79 | 9,300 | 9,178 | 16,130 |
| ශ්‍රී ලංකා රජය | - | 2,618.20 | 100 | 681 | 1,146 |
| එකතුව | 252 | 36,173.99 | 9,400 | 9,859 | 17,276 |

3.2 භෞතික ප්‍රගතිය
-----------------

ව්‍යාපෘතියේ අධිවේගී මාර්ගයේ III කොටස යටතේ වූ ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව 2013 පෙබරවාරි 05 දින විශේෂ ඉල්ලීමක් නොමැති පදනම යටතේ ප්‍රධානය කර ඒ සඳහා ණය ණය ගිවිසුමක් 2014 සැප්තැම්බර් 16 දින ණය දෙන ආයතන සමඟ අත්සන් කර තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව, ව්‍යාපෘතියේ III කොටස යටතේ වැටිය සිට අන්දර වැව දක්වා වූ දක්ෂිණ අධිවේගී මාර්ගයේ ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය 2017 දෙසැම්බර් 31 දින වන විට සියයට 49.77 මට්ටමේ පැවති අතර එදින වන විට අපේක්ෂිත භෞතික ප්‍රගතිය 98.51 ක් විය. වැඩබිම බාර දීමට ප්‍රමාද වීම, ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයීමේ ගැටළු පැවතීම සහ ප්‍රධාන වශයෙන් බිම්මාර්ග සහ පාලම් යනාදියේ කොන්ක්‍රීට් ඉදිකිරීම් භූමියේ වැඩ විෂය පථය වෙනස් වීම නිසා 2018 ජනවාරි 24 දින දක්වා මාස 10 ක කාල දීර්ඝ කිරීමක් ප්‍රධානය කර තිබූ බව නිරීක්ෂණය විය.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) කොන්ත්‍රාත් ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි 4.2 අනුව, තෝරාගත් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කිරීමට දින 28 කට පෙර කාර්යසාධන බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද, කොන්ත්‍රාත්කරු ණය ගිවිසුම 2014 සැප්තැම්බර් 16 දින අත්සන් කළ යුතු වුවද, දින 423 ක ප්‍රමාදයකින් පසුව 2015 දෙසැම්බර් 7 දින කාර්යසාධන බැඳුම්කරය බාර දී තිබුණි. තවද, කාර්යසාධන බැඳුම්කරය සඳහා වූ වියදම කොන්ත්‍රාත්කරු විසින් දරා ගත යුතු වුවද කොන්ත්‍රාත්කරු කාර්යසාධන බැඳුම්කර ලබා ගැනීම සඳහා වැයකර තිබූ රු.මිලියන 99 ක් අන්තර් ගෙවීම් සහතිකපත් මඟින් ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 (1) ඡේදයට පටහැනිව ව්‍යාපෘතියේ කාලීන එකතුකිරීම් හා අසම්භාවිතා වැඩ ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීම සඳහා සලකා බැලීමේ දී සිදු වී තිබූ යතුරු ලියන වරදක් නිසා රු.මිලියන 413 ක් වැඩියෙන් කොන්ත්‍රාත්කරුට වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) ගිවිසුමේ සාමාන්‍ය කොන්දේසි ඡේද 14.6 අනුව, රු.මිලියන 315.74 ක් ඉක්මවන වැඩවලට අදාල අන්තර් ගෙවීම් සහතික පමණක් ඇගයීම් සඳහා සලකා බැලිය යුතුයි. කෙසේ වුවත්, වටිනාකම රු.මිලියන 191.85 සිට රු.මිලියන 299.12 ක් දක්වා වූ අන්තර් ගෙවීම් සහතික සමාලෝචිත වර්ෂයේ අවස්ථා 06 කදී ඇගයීම් කටයුතු සඳහා යොදාගෙන තිබුණි.

(ඈ) ව්‍යාපෘතියේ මූලික අදියරේදී විධිමත් බිම් සමීක්ෂණයක් සිදුකර නොතිබීමේ ප්‍රතිඵලයක් ලෙස අධිවේගී මාර්ගයේ III කොටසේ සැලසුම්ගත ඉවත් කිරීමට අපේක්ෂිත පස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 1,651,700 ක් වුවත් 2017 දෙසැම්බර් 31 දින වන විට මෙට්‍රික් ටොන් 824,816 ක වැඩිපුර පස් විශාල වශයෙන් හාරා ඉවත්කර තිබුණි. තවද, ව්‍යාපෘතියෙන් සිදුවන සමාජ බලපෑම පිළිබඳ සමීක්ෂණයක් සිදු කර නොතිබුණ අතර ව්‍යාපෘතියේ ඉදිකිරීම් නිසා ප්‍රදේශයේ ජීවත්වන මහජනතාවට සිදු වූ අනාරක්ෂිත ජීවන තත්ත්වය හේතුවෙන් ඇති වූ මහජන විරෝධී ක්‍රියා හේතුවෙන් ව්‍යාපෘතියේ කි.මී. 62+073 සිට කි.මී. 65+871 දක්වා කොටසේ රු.මිලියන 635 ක් වැයකර අමතර කොන්ක්‍රීට් තාප්පයක් ඉදිකර තිබුණි.

(ඉ) සිවිල් කොන්ත්‍රාත්තුව සම්බන්ධයෙන් රසායනාගාර පරීක්ෂාව ඉටුකරන සමාගම සෘජුවම විගණකයන් වෙත තහවුරු කළ පරිදි ව්‍යාපෘතියේ හඬ පාලන පරීක්ෂාව සම්බන්ධයෙන් සිදුකර තිබූ පරීක්ෂණ වාර්තාව ව්‍යාජ අත්සන් යොදා නිකුත් කර තිබුණ අතර අදාල පෞද්ගලික සමාගම විසින් වාර්තාවේ අදාලත්වය පිළිබඳ සහතිකයක් ලබා දී නොතිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතිය විසින් වගකිව යුතු පාර්ශවයන් මේ පිළිබඳ පරීක්ෂා කර අදාල ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 මානව සම්පත් කළමනාකරණය
---------------------------------------

ජ්‍යෙෂ්ඨ භූ තාක්ෂණ ඉංජිනේරු, ජ්‍යෙෂ්ඨ ගමනාගමන සහ මාර්ග ආරක්ෂාව පිළිබඳ ඉංජිනේරු වැනි ප්‍රධාන තනතුරු ව්‍යාපෘතියේ සිවිල් ඉදිකිරීම් වැඩ ආරම්භයේ සිටම පුරප්පාඩුව පැවතුණු බැවින් එය ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපා තිබුණ බව නිරීක්ෂණය විය.

3.5 නැවත පදිංචි කිරීමේ සහ ඉඩම් අත්පත් කර ගැනීමේ ගැටළු
----------------------------------------------------------------------

ව්‍යාපෘතිය පදලන්ගල, බැදිගම්තොට සහ වැදිවැව යන වැඩබිම් නැවත පදිංචි කිරීම සඳහා සැලසුම් කර එම වැඩබිම් 03 අත්පත් කර ගැනීම හා සංවර්ධන වැඩ සඳහා රු.මිලියන 77.58 ක් වැය කර තිබුණි. කෙසේ වුවත්, වැඩබිමේ සිදුකරන ලද භෞතික පරීක්ෂාවේදී අනාවරණය වූ පරිදි ප්‍රමාණවත් ජල සැපයුම් පහසුකම් නොමැතිවීම, ඉඩම් ගොඩ කිරීමේ කටයුතු සහ ඉඩම් ඔප්පු පැවරීම් කටයුතු ප්‍රමාද වීම නිසා 2018 ජූනි 30 දින වන විට ද පදලන්ගල වැඩබිමේ පදිංචි කිරීමට නියමිත පවුල් 35 න් පවුල්

**06 ක් පමණක් පදිංචි කර තිබුණි. තවද නැවත පදිංචි කිරීමේ වැඩබිම්වල ඉඩම් ලකුණු කිරීම ද විධිමත්ව සිදුකර නොතිබුණ බවද නිරීක්ෂණය විය.**

**3.6 මූල්‍ය පාලනය සම්බන්ධ ගැටළු**

**-----------------------------------------**

**ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් යටතේ සටහන් කළ යුතු වැඩ ප්‍රමාණන පත්‍රයේ සළසා තිබූ ප්‍රතිපාදන යටතේ දේශීය විශේෂඥයින් තිදෙනෙකු සේවයේ යොදවාගෙන ඒ සඳහා එකතු වටිනාකම රු. 975,000 ක දීමනා ගෙවා තිබුණි. තවද එම ප්‍රතිපාදන යටතේ පුහුණුවන ඉංජිනේරුවන් දෙදෙනෙකු සඳහා එකතු වටිනාකම රු.මිලියන 1.78 ක් ද ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.**